දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 01/2024

මගේ අංකය- SP/EDU/AD/01

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,

දක්ෂිණපාය,

ලබුදූව,ගාල්ල.

2024.03.06

දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියළුම විදුහල්පතිවරුන්,

**<u>මුදල් අය කර තමා උගන්වන පාසලේ දරුවන් සඳහා ගුරු මහත්ම මහත්මීන්</u>**

**<u>පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වීම සම්බන්ධවයි.</u>**

දකුණු පළාතේ පාසල්වල ඇතැම් ගුරුභවතුන් තම පාසලේ ඉගෙනුම ලබන සිසුන් සඳහා පාසල් වේලාව තුල, පාසල් වේලාවෙන් පසුව හෝ සති අන්ත නිවාඩු දිනවල/රජයේ නිවාඩු දිනවල විවිධ බාහිර ස්ථානවල මුදල් අය කර අමතර පන්ති පැවැත්වෙන බවත් එම පන්තිවලට සහභාගී නොවන සිසුන්ට විවිධ බලපෑම් සිදු කරන බවත් විටින් විට වාර්තා වේ.

"සිසුන්ගේ පාසල් පැමිණීම ඉහල නැංවීම සහ පාසල් කාලය තුලදී ගුරු භවතුන් විසින් මුදල් අයකරමින් පෞද්ගලික පන්තිවල ඉගැන්වීම වැලැක්වීම " සම්බන්ධ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 2006/45 ට අතිරේකව දකුණු පළාතේ පාසල්වල ගුරුභවතුන්ට තම පාසලේ ඉගෙනුම ලබන සිසුන් සඳහා පාසල් වේලාව තුල, පාසල් වේලාවෙන් පසුව හෝ සති අන්ත නිවාඩු දිනවල/රජයේ නිවාඩු දිනවල විවිධ බාහිර ස්ථානවල මුදල් අය කර අමතර පන්ති පැවැත්වීම මෙම චක්‍රලේඛය මගින් තහනම් කරමි.

දකුණු පළාතේ මෙම ප්‍රතිපත්තිමය තීරණය සම්බන්ධයෙන් ඔබ කලාපයේ/ කොට්ඨාසයේ/ පාසලේ සියලුම ගුරුභවතුන් මැනවින් දැනුවත් කළ යුතු අතර සියලු ගුරු භවතුන් මේ පිළිබඳව දැනුවත් වූ බවට සහතිකයක් ලබා ගත යුතුය. මෙම උපදෙස් නොසලකා කටයුතු කරන ගුරුවරුන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව අවධාරණය කරමි. එසේම මෙම උපදෙස් නොසලකා කටයුතු කරන ගුරුවරුන් පිළිබඳව වාර්තාවන අවස්ථාවලදී විදුහල්පතිවරුන් විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කර නිසි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය.

පාසල් දරුවන්ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා මෙම ක්‍රියාවලිය නිසි ලෙස සිදුවේදැයි නිරන්තර අධීක්ෂණය කළ යුතු බව සඳහන් කරන අතර මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ඔබ සැමගේ සහාය බලාපොරොත්තු වෙමි.

රංජිත් යාපා
ලේකම්,
දකුණු පළාත් අධ්‍යාපන,ඉඩම්....... අමාත්‍යාංශය

රංජිත් යාපා
ලේකම්
අධ්‍යාපන ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය
දකුණු පළාත.